**කළුතර නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 29 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් බදු ආදායම රු.1,454,967 ක් අඩුවෙන් හා විනෝද බදු ආදායම රු.1,426,362 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | වරිපනම් ආදායමේ ලබා දී ඇති වට්ටම් අතිරේක බැර වෙනම ගිණුම්ගත කිරිම අවශ්‍ය නොවන අතර විනෝද බදු ආදායමෙහි සිදු වී ඇති වරද සමුච්චිත ආදායමට ගැලපී ඇති බැවින් නිවැරදි කිරිමට අවශ්‍ය නොවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වැය රු.444,500 ක් අඩුවෙන් හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.204,866 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලිපි ද්‍රව්‍ය හා ආයුර්වේද තොග ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයට ආදාල මහජන බැංකු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.783,064 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර ජාතික ඉතිරි කිරිමේ බැංකුවේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.378,097 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගැළපීම් කල යුතුවේ. | වරදක් සිදු වී නොමැත. |
| (ඉ) | පරිත්‍යාග වශයෙන් සභාවට ලැබී තිබූ රු.640,820 ක් වටිනා වත්කම් ප්‍රග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වතකම් ලේඛනය හා සමීක්ෂණ වාර්තා නොමැතිවීම නිසා එකතුව රු.28,538,949 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව |

1.3.3 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 නගර සභා ආඥා පනත (i) 164 (2) වගන්තිය | | 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල සංවර්ධන පනතේ සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක් සඳහා බලපත්‍ර ලබාදීමේදී වර්ෂයේ ලැබීම්වලින් සියයට එක දක්වා ගාස්තුවක් අයකර වෙළඳ බලපත්‍රය නිකුත් කළ යුතු වුවත්, වෙළඳ බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර කටයුතු වල නිරත වන සංචාරක හෝටල් 02 ක් නිරීක්ෂණය විය. | ගාස්තු අයකර වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරිමට කටයුතු කල යුතුය. | එකඟ වෙමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) 170 (2) වගන්තිය | | හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් කර නොතිබුණි. | කඩිනමින් හිඟ වරිපනම් බදු අයකර ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) | 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත | | විනෝද හෝ තරඟ ක්‍රීඩාවකින් ලැබෙන ආදායම මත සභාව තීරණය කරනු ලබන විනෝද බද්දක් අයකල යුතු වුවත් එසේ කර නොතිබුණි. | විනෝද හෝ තරඟ ක්‍රීඩාවකින් ලැබෙන ආදායම මත සභාව තීරණය කරන මුදලක් බදු ලෙස ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ඇ) | 2017 නොවැම්බර් 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | 170,298 | කළුතර නගර සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු 49 කින් වර්ෂයට අදාල ගාස්තු අය කර නොතිබුණි. | ආදායම් අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඈ) | 2008 ජනවාරි 25 දිනැති අංක1533/16 දරන ගැසට් පත්‍රය | - | විධිමත් සමීක්ෂණයක් සිදු කරමින් පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් සමීක්ෂණයක් සිදු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 වගන්තිය | | සභා වාහන 19 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | සියළුම වාහන වල වාර්ෂිකව ඉන්ධන දැවීම පරීක්ෂා කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඊ) | 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛය | - | සභාව සතු කඩ කාමරවල දීර්ඝ කාලීනව උපබදුකරුවන් ලෙස ව්‍යාපාරික කටයුතු කරනු ලබන්නන්ට බදු අයිතිය පැවරීමට කටයුතු කර නොතිබුණ අතර සභාව සතු කඩ කාමර බදු දිමේදී යටත් පිරිසෙන් වර්ෂ 03 කට වරක් වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කර නොතිබුණි. | උප බදුකරුවන්ට බදු අයිතිය පැවරීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,567,270 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,467,269 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 26,363,000 | 31,407,662 | 19,342,277 | 23,048,163 | 26,780,000 | 31,737,119 | 23,035,401 | 18,884,608 |
| (ii) | කුලී | 13,665,000 | 11,518,852 | 10,647,589 | 1,152,468 | 11,525,000 | 10,279,760 | 10,993,352 | 835,509 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,001,000 | 375,464 | 375,464 | - | 1,003,000 | 335,326 | 335,326 | - |
| (iv) | වෙනත් ආදායම් | 47,792,000 | 41,090,794 | 41,090,794 | 20,000,000 | 43,380,000 | 51,799,261 | 51,799,261 | - |

#### 2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්යය සාධනය

(අ) වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.16,035,392 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.6,131,833 ක් පමණක් අයකර ගෙන තිබුණි. | හිඟ වරිපනම් අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ii) වාර්ෂික බිල් කිරිම රු.23,247,761 ක් වු අතර වර්ෂය තුලදී ඉන් රු.15,242,050 ක් අයවී තිබුණි. | හිඟ වරිපනම් අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (iii) සමාලෝචිත වර්ෂය අවසානයට වු හිඟ වරිපනම් බදු ශේෂය තුල අවු.10 ට වැඩි ඒකක 1839 කින් රු.3,365,906 ක්ද අවුරුදු 5-10 ත් අතර රු.3,713,422 ක්ද , අවුරුදු 3-5 ත් අතර | හිඟ වරිපනම් අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| රු.1,393,807 ක්ද , අවුරුදු 01-03 අතර රු.5,779,253 ක් විය. | | |
| (ආ) විනෝද බදු | | |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට විනෝද බදු ශේෂය රු.2,849,216 ක් වූ අතර වර්ෂය අවසානයේදී ඉන් රු.2,553,886 ක් හෙවත් සියයට 90 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ බදු අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ii) වර්ෂයේ විනෝද බදු බිල් කිරිම රු.3,747,170 ක් වූ අතර ඉන් වර්ෂය අවසානයට රු.1,111,441 ක් හෙවත් සියයට 30 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ බදු අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඇ) ව්‍යාපාර බදු | | |
| සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර බදු බිල් කල මුදල රු.2,934,920 ක් වූ අතර , ඉන් වර්ෂය අවසානය වනවිට රු.1,180,900 ක් හෙවත් සියයට 40 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ බදු අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙළඳ ස්ථාන කුලී | | |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වෙළඳ ස්ථාන හිඟ කුලී ශේෂය රු.570,429 ක් වූ අතර එකී හිඟයෙන් වර්ෂය අවසානයට රු.281,205 ක් හෙවත් සියයට 49 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ කුලී අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ii) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරිම රු.6,944,110 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.6,403,435 ක් ලැබී තිබුණු අතර , වර්ෂය අවසානයට රු.540,675 ක් හෙවත් සියයට 08 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ කුලී අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) බදුකර කුලී | | |
| සමාලෝචිත වර්ෂය සඳහා බදුකර කුලී බිල් කිරිම රු.178,100 ක් වූ අතර ඉන් වර්ෂය අවසානය වන විට | හිඟ කුලී අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

රු.72,700 ක් හෙවත් සියයට 41 ක් අයවිය යුතුව තිබුණි.

(ඇ) තානායම් කුලී
------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ සභාවේ හිඟ තානායම් කුලිය රු.300,869 ක් වූ අතර වාර්ෂික බිල් කිරිම රු.300,869 ක් විය. ඒ අනුව වර්ෂය සඳහා අයවිය යුතු මුළු තානායම් කුලියෙන් වර්ෂය අවසානය වනවිට රු.257,888 ක් හෙවත් සියයට 43 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ තානායම් කුලී අය කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

2.2.4 මුද්දර ගාස්තු
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ රු.4,726,433 ක මුද්දර ගාස්තු ශේෂයක් විය | වර්ෂයට අදාල මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා | | |
| නගර සභා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා දෙකක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | ඉතිරි කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| සභාව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර එහි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කර ප්‍රගතිය | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කලේද යන්න තහවුරු | එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| මිණුම් කලයුතු වුවද , ප්‍රධාන විෂයයන් 14 යටතේ රු.මි. 132.775 පිරිවැයක් සහිත ප්‍රධාන ක්‍රියාකාරකම් 236 ක් හදුනාගෙන එහි වගකීම් හා අධීක්ෂණ කටයුතු සඳහා වගකිව යුතු නිලධාරින් පත්කර තිබුණ ද , වර්ෂය තුළ එම ක්‍රියාකාරකම් ඉටුකිරීමේ ප්‍රගතිය කොපමණද යන්න පිළිබඳ මිණුම් කර කාර්ය සාධන වාර්තාවක් සකස් කර නොතිබුණි. | කිරිම සඳහා කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කල යුතුවේ. | |
| **(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| (i) 2018 වර්ෂයේ නගර සභාවේ කසළ කළමනාකරණය වෙනුවෙන් රු.48,847,455 ක වියදමක් දරා තිබුණු අතර , මෙම වියදමට අමතරව නොදිරන කසළ තුනීකර පස් දැමීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.4,926,006 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් 2018 වර්ෂයේ සමස්ථ වියදම රු.53,773,461 ක් විය. | නිවැරදි කසළ කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර පිරිවැය අවම කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ii) අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොතිබුණ අතර කසළ බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍රය ලබා ගැනීමක්ද සිදු කර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගතයුතු අතර කසල බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතුවේ. | එකඟ වෙමි. |
| (iii) වාණිජ ආයතනවල කසළ බැහැර කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් සම්පත් සභාවට තිබියදී 2018 මැයි 08 දින තීරණ අංක 5.1.13 මගින් නොදිරන කසළ ටොන් 03 ක ටිපර් රථයක් රු.2,500 ක මුදලකට පෞද්ගලික ආයතනයකට කසළ බැහැර කිරිම සඳහා පවරා දී තිබුණි. | වාණිජ ආයතනවල කසළ බැහැර කිරීමේ කටයුතු සභාව විසින් කල යුතු යුතුවේ. | එකඟ වෙමි. |
| **(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාව දැනුවත් වී තිරසර සංවර්ධන සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | එකඟ වෙමි. |

(ඉ) මහජන සුභසාධන අරමුණු නිසි ලෙස ඉටු නොවීම

| | | |
|---|---|---|
| සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් 03 ක ශේෂය රු.20,549,917 ක් විය. තවද රු.මි.78.7 ක ස්ථාවර තැන්පත් පැවතුනි. මේ අනුව සභාවේ මුල්‍ය තත්වය යහපත් මට්ටමක පැවති නමුත් සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කර ඇති ප්‍රාග්ධන ව්‍යාපෘති ගණන 19 ක් වූ අතර ඒ සඳහා වියදම රු.18,133,601 ක් විය. මේ හේතුවෙන් සංවර්ධන කටයුතු පුළුල් කිරීමේ හැකියාවක් සභාවට පැවතුණි. | සභාවේ මුල්‍ය තත්ත්වය යහපත් මට්ටමක පවතින බැවින් තවදුරටත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් මහජන සුභ සාධනය නංවාලිය යුතුවේ. | එකඟ වෙමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථිර කාර්ය මණ්ඩලයට අතිරේකව රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 25/2014 අනුව නිලධාරීන් 06 දෙනෙකු ස්ථිර සේවකයින් ලෙස බඳවාගෙන තිබුණු අතර , අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය වැඩි කර ගැනිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ii) | සභාවේ තනතුරු 40 කට අදාල අනුමත කාර්ය මණ්ඩලය 314 ක් වූ අතර , නිත්‍ය සේවක සංඛ්‍යාව 273 ක් විය. ඒ අනුව තනතුරු 18 ක පුරප්පාඩු 42 ක් නිරීක්ෂණය වූ අතර ගණකාධිකාරි හා ලේකම් තනතුරුවලද පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (iii) | ක්ෂේත්‍ර කම්කරුවන් ලෙස සේවකයින් 57 දෙනෙකුද , සෞඛ්‍ය කම්කරවන් ලෙස සේවකයින් 82 දෙනෙකුද බඳවාගෙන තිබු අතර , මෙයින් වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් ලෙස සේවකයින් 37 දෙනෙකුද , සෞඛ්‍ය කම්කරුවන් ලෙස සේවකයින් 63 දෙනෙක්ද | චක්‍රලේඛය අනුව කටයුතු යුතුවේ. | එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| අදාල රාජකාරිවල යොදවා සිටියදි වෙනත් රාජකාරි සඳහා සේවකයින් 39 ක් යොදාගෙන තිබුණි. | | |
| (ආ) විනය කටයුතු<br>---------------- | | |
| 2018 වර්ෂයේ සභා තීරණ පොත අස්ථානගතවී තිබුණ ද ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන නොතිබුණි. | වගකිව යුතු නිලධාරින් කඩිනමින් හඳුනාගෙන විනය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඇ) සේවක ණය<br>-------------- | | |
| සේවය හැර ගිය/මියගිය නිලධාරින් 49 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය ශේෂය රු.566,078 ක් වූ අතර, 2016 හා 2017 වර්ෂ වලදී විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය ශේෂය රු.123,295 ක් විය. | කඩිනමින් හිග ණය ශේෂ අයකර ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ඈ) සේවක ඇප<br>-------------- | | |
| 1998 වර්ෂයේ සිට නිලධාරින්ගෙන් අයකර ගෙන තිබූ රු.107,564 ක් වූ ඇප තැන්පත් බැංකු ගිණුමක ආයෝජනය කර නිලධාරින්ට ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් බැංකු ගිණුමක ආයෝජනය කල යුතුවේ. | එකඟ වෙමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කළුතර දකුණ ධර්මාරාම පාර ත්‍රැපොබෙන් ජාත්‍යන්තර පාසැලට ප්‍රවේශ වන ස්ථානයේ සිට ගඟ පාර දෙසට දකුණු පැත්තේ පිහිටි නිවෙස් වලින් පිටවන අප ජලය නගර සභාව සතු විවෘත කාණුවට මුදා හැරීම සම්බන්ධව සභාව කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි. | නිතීමය පියවර ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) කල් ඉකුත්ව තිබූ පරිසර බලපත්‍ර 20 ක් වෙනුවෙන් නව පරිසර බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු කර නොතිබුණි. | නව පරිසර බලපත්‍ර නිකුත් කල යුතුවේ. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බඩු ගබඩා පාර , නව වෙළඳසැල් සංකීර්ණයේ බී 08 දරන කඩ කාමරයේ හා නගර සභාව අසල අංක 37 දරන කඩ කාමරය කොටස් දෙකකට බෙදා අතුරු බදු දීම් සිදුකර තිබුණු අතර අනවසර වෙනස්කිරීම් හා අතුරුබදු දීම් සම්බන්ධයෙන් ද ගතයුතු ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | අනවසර වෙනස් කිරීම් හා අතුරු බදුදීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ඈ) | බාහිර පාර්ශවයන් වෙත බදු දී තිබු සභාව සතු ඉඩම් සඳහා 2017 වර්ෂයේ සිට අයවිය යුතු බදු කුලී අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබු අතර ව්‍යාපාරික කටයුතු සඳහා බදුදී තිබු ආයතන දෙකකින් 2008 හා 2011 වර්ෂවල සිට මාසික බදු කුලී සංශෝධනය කිරිමට කටයුතු කර නොතිබුණි. | කාලීනව බදුකුලී සංශෝධනය කර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඉ) | බඩු ගබඩා පාර , අංක 168 , A 10 හා A 26 යන සභාව සතු කඩ කාමර වලින් පිළිවෙලින් රු.75, රු50 හා රු. 30 ක් වැනි අඩු බදු මුදලක් අය විය යුතුව පැවතුණි. | කාලීනව බදුකුලී සංශෝධනය කර නව කුලි අයකල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඊ) | කළුතර උතුර , පළවන හරස් වීදියේ කඩ අංක 02 හා 03 යන කඩ කාමර වලට අදාලව පිළිවෙලින් 1982, 1985 යන වර්ෂ වලින් පසු බදු ගිවිසුම් අළුත් කර නොතිබුණි. | බදු ගිවිසුම් යාවත්කාලීන කල යුතුවේ. | එකඟ වෙමි. |

3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී වෙට්ටුමකඩ පකිස්ථාන ක්‍රීඩාපිටිය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි දැල් වැටක් ගසා තිබුණි. ක්‍රිඩාංගනය මැදින් ප්‍රවේශ මාර්ගයක් ඇතිකර ගෙන භාවිතයට ගැනීම නිසා එම ප්‍රවේශ මාර්ගයෙන් පිවිසුම සඳහා ක්‍රිඩා පිට්ටනියේ පිටු පසින් උසින් අඩි 04 ක් හා පළල අඩි 03 ක් වන සේ පිවිසුම් දොරටුවක් දැල් වැටට හානි වන සේ සකස් කර තිබුණි. | ක්‍රිඩා පිටියේ ආරක්ෂාව තහවුරු කල යුතුවේ. | එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව හදුනාගන්නා ලද ඌණතා අතිරික්තතා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය පියවර ගත යුතුවේ. | එකඟ වෙමි. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේදී රු.4,450,000 ක් වැය කර ස්ථාපිත කරන ලද කාර්යාලීය කටයුතු පරිගණක ගත කිරීමේ මෘදුකාංග පද්ධතියෙන් වර්ෂය අවසාන වන විටත් මෘදුකාංග පද්ධති 03 ක් නිශ්ක්‍රියව පැවතුණි. | එකී මෘදුකාංග පද්ධති කඩිනමින් ක්‍රියාත්මක කර වීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

3.5.2 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ධාවන තත්ත්වයේ නොපවතින වාහන 05 ක් අළුත්වැඩියා කර ධාවනය කිරිමට හෝ අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | ධාවන තත්ත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) මාස 03 සිට මාස 09 ක කාල සීමාවක සිට ධාවනයෙන් ඉවත් කළ පිරිවැය රු.1,390,000 ක් වූ ට්‍රැක්ටර් දෙකක් අළුත්වැඩියා සිදුකර ධාවනයට යොදවා නොතිබුණි. | කඩිනමින් අළුත්වැඩියා කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඇ) පිරිවැය රු.2,212,000 වු ට්‍රැක්ටර් 04 ක් හා ට්‍රේලරයක් වසර 01 සිට වසර 05 දක්වා කාල සීමාවක් හා මයික්‍රෝ කැබ් රථය 2018 ඔක්තෝබර් සිට ධාවන තත්ත්වයේ නොතිබුණු අතර ඒවායේ දෝෂයන් හදුනාගෙන අළුත්වැඩියා කිරිමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අළුත්වැඩියා කිරිමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

3.5.3 පුස්තකාල පොත් සමීක්ෂණය

| ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නගර සභාව සතු ප්‍රධාන පුස්තකාලයේ සහ උප පුස්තකාල 03 හි සමීක්ෂණ කටයුතු 2016 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. | වාර්ෂිකව සමීක්ෂණය කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) 2016 වර්ෂයේ සමීක්ෂණයේදී ආවරණය වූ පොත් 440 ක ඌනතාවයක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඌනතාවය පිළිබඳව පරික්ෂණයක් පවත්වා අලාභ අයකර ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ඇ)2016 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව ළමා පුස්තකාලයේ වටිනාකම ගණනය නොකරන ලද පොත් 2312 ක් විනාශ කිරිමට යෝජනා කර තිබුණ ද 2019 ජුනි වන විටත් එකී කාර්යය ඉටු කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කල යුතුවේ. | එකඟ වෙමි. |

3. 6 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළුතර උතුරේ ස්ථාපිත කර ඇති හෝටලය සඳහා අනුකූලතා සහතිකය ලබා ගැනීමට යටත්ව පරිසර බලපත්‍රය ලබා දීමට නිර්දේශ කර තිබුණ ද ඊට පටහැනිව කටයුතු කරමින් පරිසර බලපත්‍ර ලබා දී තිබුණි. | නිර්දේශ වලට පටහැනිව කටයුතු කිරිම සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගත යුතුවේ. | එකඟ වෙමි. |

3.7 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කටුකුරුන්ද නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 වර්ෂයේ සිදු වූ සොරකමින් රු.115,250 ක පාඩුවක් සිදු වී තිබුණි. | පරික්ෂණයක් පවත්වා පාඩු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| (ආ) 2019 ජනවාරි 17 දිනට රු.134,400 ක් වූ තාර බැරල් 08 ක ඌනතාවයක් විය. | ඌනතාවය පිළිබඳ පරීක්ෂණ පවත්වා අදාල පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගත යුතුවේ. | එකඟ වෙමි. |

3.8 ප්‍රසම්පාදනය

----------------

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණ ද , 2018 මාර්තු මාසයේ සිට සභා අනුමැතිය ලබා දී තිබූ රු.මි.32.46 ක පිරිවැය ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |

3.8.2 සැපයීම් හා සේවා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභා කාමරයට මේස ලබා ගැනිමේදී ලී වල ඝනකම මි.මි.25 විය යුතු වුවත්, සපයා තිබූ ලී බඩුවලට අදාළ ලීවල ඝණකම මි.මි.22 වී තිබීමෙන් සපයා ඇති භාණ්ඩ පිරිවිතර වලට අනුකූල නොවීය. | පිරිවිතර වලට අනුකූලව භාණ්ඩ සපයා ගත යුතුවේ. | එකඟ වෙමි. |
| (ආ) සභාපති හා මන්ත්‍රීවරුන් සඳහා පුටු මිළ දී ගැනිමේදී අවම මිළ ඉදිරිපත් කර ඇති සැපයුම්කරු තෝරා නොගැනීම නිසා සභාවට රු.240,100 ක පාඩුවක් සිදුවී තිබුණි. | සභාවට වාසි සහගත වන පරිදි කටයුතු කල යුතුවේ. | එකඟ වෙමි. |
| (ඇ)කාර්යාල කටයුතු පරිගණක ගත කිරිම සඳහා ආයතනයක් තෝරා ගැනීමේදී ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කර ඇතත් ඇගයීම් කටයුතු සිදු කිරිම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙනුවට | ඇගයීම් කටයුතු ඇගයීම් කමිටුවක් මගින් සිදු කළ යුතුවේ. | එකඟ වෙමි. |

ආයතනයක් තෝරාගෙන තිබුණු අතර එම ආයතනය තෝරා ගැනීමේදි අවම මිල ඉදිරිපත් කල ආයතනය තෝරා නොගැනීම හේතුවෙන් සභාවට රු.1,650,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

3.8.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා සමිතියක් තෝරා ගැනිමේදී අදාළ සුදුසුකම් සලකා බැලීමකින් තොරව රු.මි.8.12 ක් වු ව්‍යාපෘති 04 ක් කොන්ත්‍රාත් සමිති වෙත පවරා තිබුණි. | කොන්ත්‍රාත් සමිති වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරිමේදී අදාළ සුදුසුකම් පරීක්ෂා කල යුතුවේ. | සමිති මූල්‍ය ශක්තිය , හැකියාව පිළිබඳ තොරතුරු සමිති මගින් ගෙන්වා ගෙන සහා අනුමැතිය මත කොන්ත්‍රාත් පිරිනමා ඇත. |
| (ආ) | කළුතර දුව පන්සල පාර තාර දමා සංවර්ධනය කිරිම<br>-------------------------------------------<br>කළුතර දුව පන්සල පාර තාර දමා සෘජු ශ්‍රමය යටතේ සංවර්ධනය කිරිම සඳහා රු.මි.2.97 ක පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කලද ද්‍රව්‍ය හා ශ්‍රම විශ්ලේෂණ ඇස්තමේන්තු සකස් කර අනුමත කර නොතිබුණි. | ද්‍රව්‍ය හා ශ්‍රම විශ්ලේෂණ සකස් විය යුතු වේ. | ඇස්තමේන්තු සකස් කර අනුමත කර ඇත. |